www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## තුන්වන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

8 ශ්‍රේණිය | සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | කාලය - පැය 1

### 17 - පාරසරික අභියෝග වලට සාර්ථකව මුහුණදෙමු.

### I කොටස

- 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) රෝගාබාධ, අනතුරු, ආපදා ආදී අභියෝග පොදුවේ හඳුන්වන්නේ,
1) කායික අභියෝග ලෙසය. 2) ශාරීරික අභියෝග ලෙසය.
3) පාරිසරික අභියෝග ලෙසය. 4) සමාජයීය අභියෝග ලෙසය.

(2) අනතුරු ඇතිවීමට ප්‍රධානම හේතු වන්නේ,
1) නොසැලකිලිමත් බව 2) නොදැනුවත් බව
3) අවධානය අඩුවීම 4) නොසැලකිලිමත් බව හා නොදැනුවත් බව

(3) සුනාමි ව්‍යසනය අප රටට බලපෑවේ.
1) 2004 දෙසැම්බර් 26 2) 2014 දෙසැම්බර් 25
3) 2005 නොවැම්බර් 15 4) 2007 දෙසැම්බර් 25

(4) පොළොව ඉරිතැලීම හා ජල උල්පත් මතුවීම දක්‍ක ගත හැක්කේ කුමන ආපදාවට පෙරද?
1) සුනාමි 2) ගංවතුර 3) නායයෑම් 4) භූමි කම්පා

(5) විවිධ සමාජ විරෝධී ක්‍රියාවල යෙදීම පොදුවේ හඳුන්වන්නේ,
1) හිංසා කිරීම ලෙසය. 2) අපචාර ලෙසය.
3) අපයෝජන ලෙසය. 4) සොරකම් කිරීම ලෙසය.

(6) වෙනත් පුද්ගලයන් විසින් කෙනෙකු සමාජ විරෝධී ක්‍රියා සඳහා පොළඹවා ගැනීම හඳුන්වන්නේ,
1) හිංසා කිරීම ලෙසය. 2) අපචාර ලෙසය.
3) අපයෝජන ලෙසය. 4) අතවර ලෙසය.

(7) මත් ද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ,
1) මධ්‍යසාර හා දුම්වැටි
2) අරක්කු, සිගරට් ආදිය යි.
3) මධ්‍යසාර වලට ය.
4) මධ්‍යසාර, දුම්වැටි හා අනෙකුත් සියලුම මත් වන ද්‍රව්‍ය.

(8) ආසාදිතයෙකු මඟින් වෙනත් පුද්ගලයෙකුට වැළඳෙන රෝග හඳුන්වන්නේ,
1) බෝවන රෝග ලෙසය. 2) බෝනොවන රෝග ලෙසය.
3) වාහක රෝග ලෙසය. 4) සම්ප්‍රේෂණ රෝග ලෙසය.

(9) ඒඩ්ස් රෝගය සමාජය තුළ පැතිරී යාමට මූලික හේතුවක් වන්නේ,
1) විදේශිකයන්ගේ පැමිණීම. 2) නීතිරීති වල ලිහිල්බව
3) සමාජ සාරධර්ම පිරිහීයාම. 4) දැනුවත් නොවීම.

(10) පහත දැක්වෙන රෝග අතරින් බෝවෙන රෝගයක් නොවන්නේ,
1) මී උණ 2) පිළිකා 3) සාර්ස් 4) කොලරාව (2 x 10 = 20)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

## II කොටස

| | | |
|---|---|---|
| (1) | පාරිසරික අභියෝග 5 ක් නම් කරන්න. | (ල. 5) |
| (2) | අනතුරු නිසා ඇතිවන හානිදායක තත්ව 5 ක් නම් කරන්න. | (ල. 10) |
| (3) | අනතුරු වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 5 ක් ලියන්න. | (ල. 5) |
| (4) | අනතුරකදී සිදුවන හානිය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 3 ක් ලියන්න. | (ල. 3) |
| (5) | අප මුහුණ දෙන ආපදා 2 ක් ලියන්න. | (ල. 2) |
| (6) | ආපදා නිසා ඇත්වන හානි 5 ක් ලියන්න. | (ල. 10) |
| (7) | ආපදා අවස්ථාවලදී සිදුවන හානිය අවම කිරීමට කළ යුතු දේවල් 5 ක් ලියන්න. | (ල. 10) |
| (8) | ළමා අපචාර හා අපයෝජන වලට උදාහරණ 5 ක් ලියන්න. | (ල. 5) |
| (9) | අපචාර හා අපයෝජනවලින් වැළකීමට ගත හැකි ක්‍රියාමාර්ග 5 ක් ලියන්න. | (ල. 5) |
| (10) | අපචාර හා අපයෝජන නිසා සිදුවන හානි 5 ක් ලියන්න. | (ල. 10) |
| (11) | මත්ද්‍රව්‍ය වලට නිදසුන් 5 ක් ලියන්න. | (ල. 5) |
| (12) | මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඇතිවන හානි 5 ක් ලියන්න. | (ල. 5) |
| (13) | රෝගාබාධ නිසා ඇතිවන හානි 5 ක් ලියන්න. | (ල. 5) |

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk